# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

<u>ව්‍යාපෘති කාර්යය මණ්ඩලය සඳහා අයදුම්පත් කැඳවීම</u>

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ ඩිජිටල් අධ්‍යාපන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් e-ඉගෙනුම් ක්‍රමවේදයක් හඳුන්වාදීම උදෙසා ජාතික ඉ-ඉගෙනුම් වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම සහ සමස්ත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය සඳහා විස්තීරණ වූ වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම කොරියානු EXIM බැංකුවෙහි මූල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මක වේ. මෙම “Establishment of ICT Hubs for Secondary Education (GOSL/EDCP)-SRI-31” ව්‍යාපෘතියට අදාළව මාස 27 ක කාලයක් සඳහා පහත තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | වැටුප් මට්ටම | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | A | 1 |
| ප්‍රසම්පාදන විශේෂඥ | C | 1 |
| මූල්‍ය කළමනාකරු | C - I | 1 |
| ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | D | 1 |
| ව්‍යාපෘති නිලධාරී | F | 1 |
| තාක්ෂණ නිලධාරී | F | 1 |
| ව්‍යාපෘති කළමනාකරණ සහායක | කළ.සේ.ව. 02/2026 හි (3:2:3) හි විධිවිධාන අනුව | 3 |
| කාර්යාල කාර්යය සහායක | | 1 |
| රියදුරු | | 1 |

**සියලුම තනතුරු සඳහා පොදු කොන්දේසි**

1. **සුදුසුකම් සහ අයදුම්පත් -** https://moe.gov.lk වෙබ් ලිපිනය මගින් ලබා ගත හැක.

2. **වැටුප් ප්‍රමාණය -** 2026 මාර්තු මස 28 දිනැති කළ.සේ.ව. 02/2026 හි විධිවිධාන අනුව අදාළ ගෙවීම් කිරීම සිදු කරනු ලැබේ.

3. **සේවා නියුක්ති කොන්දේසි**

   a. ව්‍යාපෘති අවශ්‍යතාවය සහ කාර්ය සාධනය මත අලුත් කිරීමට යටත්ව, මාස 27 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්වීම සිදු කෙරේ.

   b. රාජ්‍ය නිලධාරීන්ගෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු සඳහා පූර්ණ කාලීනව නිදහස් කිරීමේ පදනම මත බඳවා ගනු ලබන අතර, අනෙකුත් රාජ්‍ය නිලධාරීන් රජයේ ද්විතීයික පදනම මත සේවාවන්ගෙන් පිටත කොන්ත්‍රාත් පදනමට අනුව නැවත බඳවා ගනු ලැබේ.

   c. සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

   d. අයදුම්කරුවන් තම ජීව දත්ත පත්‍රිකාව අදාළ අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර සමඟ

"ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026.08.29 වන දින පස්වරු 3.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතු ය.

e. අයදුම්පත බහා ඇති කවරයේ ඉහළ වම් කෙළවරේ වැඩසටහනේ නම (Establishment of ICT Hubs for Secondary Education Project) සහ අයදුම් කරන තනතුර පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල